සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# පළමු වාර පරීක්ෂණය 2018
# ඉස්ලාම් ධර්මය

8 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

## I - කොටස

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 ''තවුහීද්'' හට එරෙහි වන සියලු විශ්වාසයන්

(i) ෂිර්ක් (ii) මආද් (iii) ඉබාදත් (iv) රිසාලත්

02 ''නුඹවම නමදිමු, නුඹගෙන්ම උදව් ඉල්ලමු'' යන වාක්‍ය තිබෙන සූරා

(i) අල් හලක් (ii) අල් ඉඛ්ලාස් (iii) අල්පාත්තිහා (iv) අන්නාස්

03 ඉන්ජීල් ආගම ලත් නබිවරයා

(i) නබි ආදම් (අලෛ) (ii) නබි දාවුද් (අලෛ)

(iii) නබි මූසා (අලෛ) (iv) නබි ඊසා (අලෛ)

04 ''කලීමුල්ලාහ්'' යන විශේෂ නාමයෙන් හඳුන්වන නබිවරයා

(i) නබි ඉබ්රාහිම් (අලෛ) (ii) නබි නූහ් (අලෛ)

(iii) නබි මූසා (අලෛ) (iv) නබි ඊසා (අලෛ)

05 ''සලාතය ස්වර්ගයේ පිවිසුම් දොරටුව'' යන වැකිය

(i) අල්කුර්ආන් (ii) හදීස් (iii) වියතුන්ගේ කියමනකි (iv) ප්‍රස්ථා පිරුලකි

06 තනිවම ඉටුකළ හැකි සලාතය

(i) සලාතුල් ජුමුආ (ii) සලාතුල් ජනාසා

(iii) සලාතුල් හාජා (iv) සලාතුල් කුසුපෙන්

07 මෙලොවට පහළ වූ රසූල්වරුන්ගේ සංඛ්‍යාව

(i) 24000 (ii) 25 (iii) 313 (iv) 15

08 සජ්දා අඩංගු අල්කුර්ආන් ආයත් පාරායනය කරන්නා ඉටුකළ යුතු සජ්දා වර්ගය

(i) ෂුක්ර් (ii) සහ්වු (iii) තිලාවත් (iv) සුජුද්

09 අල්කුර්ආනයේ සජ්දා සඳහන් වී තිබෙන ස්ථාන සංඛ්‍යාව

(i) 10 (ii) 15 (iii) 14 (iv) 13

10 රමලාන් මාසයට පෙර මාසය කුමක් ද?

(i) රජබ් (ii) ශව්වාල් (iii) ශහ්බාන් (iv) දුල්හිජ්ජා

11 උපවාසයේ ප්‍රධාන අරමුණ

(i) කීකරුවීම (ii) කුසගින්න දැනීම (iii) ආරක්ෂා වීම (iv) තක්වා

12 සකාත් ලබාගැනීමට හිමිකම් ඇති කණ්ඩායම්

(i) 6 (ii) 7 (iii) 8 (iv) 9

13 ප්‍රාර්ථනා කිරීමේ දී අනුගමනය කළයුතු එක් කරුණක් වන්නේ,

(i) තුන්වතාවක් ඇසීම (ii) වුළු නැතුව ඇසීම

(iii) කිබ්ලාව පසුකිරීම (iv) කලින් සඳහන් සියලු දේ

14 අල්කුර්ආනයේ තිබෙන සූරා සංඛ්‍යාව

(i) 113 (ii) 114 (iii) 115 (iv) 116

15 නබිවරුන්ට ලබාදී ඇති සහුපුවල එකතුව

(i) 109 (ii) 102 (iii) 110 (iv) 111

- **පහත සඳහන් වගන්ති හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද වරහන්තුළ යොදන්න.**

16. අල්ලාහ් තමාගේ සෙනෙහසේ කොටස් 99 ක් මෙළොවට පහළ කළා. ( )
17. ''අල්වදූද්'' යන නාමය අල්ලාහ් තආලාගේ සෙනෙහස හෙළි නොකරයි. ( )
18. අල්ලාහ් නබිවරුන්ට ආගම් හා සුහුපු ලබාදුන්නේ ය. ( )
19. ''තව්හීද්'' හට එරෙහි වන සියලුමදේ ඊමාන් වේ. ( )
20. අල්ලාහ් ''ආද්'' සමාජය සුළඟ මගින් විනාශ කළේය. ( )

- **සුදුසු වචන තෝරා හිස්තැන් පුරවන්න.**

21. නබි මූසා (අලෛ) වෙත ..................................................... විශ්වය ලබා දෙන ලදී.
22. ඊමානය, කුප්රු අතර වෙනස ..................................................... වේ.
23. සියලු වස්තුවල ලබාදිය හැකි දේ ..................................................... වේ.
24. එක් දිනක අවසානයේ ඉටු කළ යුතු සලාතය .....................................................
25. නබි සුලෛයිමාන් වෙත ලබ දෙන ලද විශ්මය ..................................................... වේ.

(ජින් සුළඟ, වසීවීම / සලාතය / සදකා / හැරමිටිය සර්පයෙකු වීම / විත්රු)

(ලකුණු 2 x 25 = 50)

**8 ශ්‍රේණිය** **ඉස්ලාම් ධර්මය - II කොටස**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01 (i) ඊමානයේ මූලික විශ්වාසයන් තුනක් ලියන්න.

(ii) අල්ලාහ්ගේ ආදරය හෙළිදරව් කරන අස්මාඋල් හුස්නා (නම්) 4 ක් ලියන්න.

(iii) අල්ලාහ්ගේ සෙනෙහස හෙළිදරව් කරන හදීස් එකක් ලියන්න.

(ලකුණු 3 + 4 + 3 = 10)

02 (i) අල්කුර්ආනය කුමන නබිවරයාට විශ්මය වශයෙන් පහළ වූයේ ?

(ii) අල්කුර්ආනයේ අන්තර්ගත 04ක් ලියන්න.

(iii) අල්කුර්ආනය පිළිබඳව පහත කරුණු ගැන ලියන්න.

1. ආයත්
2. සූරා
3. ජුස්උ

(ලකුණු 3 + 4 + 3 = 10)

03 (i) අල්කුරානයේ සඳහන් උලුල් අස්ම් නබිවරුන්ගේ නම් ලියන්න.

(ii) සුහුෆු ලබාදෙන ලද නබිවරුන් හා ඔවුන්වෙත ලබාදෙන ලද සුහුෆු සංඛ්‍යාව ද ලියන්න.

(ලකුණු 5 + 5 = 10)

04 (i) සලාතය මගින් එළොවෙහි ලැබෙන ප්‍රයෝජන 04 ක් ලියන්න.

(ii) සලාතය මගින් මෙළොවෙහි ලැබෙන ප්‍රයෝජන 04 ක් ලියන්න.

(iii) සලාතය ගැන ඔබ දන්නා හදීස් 04 ක් ලියන්න.

(ලකුණු 4 + 4 + 2 = 10)

05 (i) සලාතයේ පර්ලූ ගණයේ පාරායන 03 ක් ලියන්න.

(ii) සලාතයේ සුන්නත් ගණයේ හාරායන 03 ක් ලියන්න.

(iii) සජ්දා ෂුකුර් ඉටුකරන අවස්ථා 4 ක් ලියන්න.

(ලකුණු 3 + 4 + 4 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) ෂිර්ක් (02) අල් පාතිහා (03) ඊසා (අලෛ) (04) මූසා (අලෛ) (05) හදීස්
(06) සලාතුල් හාජා (07) 313 (08) තිලාවත් (09) 15 (10) ෂහ්බාන්
(11) තක්වා (12) 8 (13) 3 වතාවක් (14) 114 (15) 110 (16) ✗ (17) ✓ (18) ✓
(19) ✗ (20) ✓ (21) හැරමිටිය සර්පයෙකු විම (22) සලාතය (23) සදකා
(24) විත්රු (25) ජින්, සුළඟ, වසීවීම

## II කොටස

01 (i) තව්හීද්, රිසාලත්, මආද්

(ii) අර්රහ්මාන්, අර්රහීම්, අල්වදූද්, අත්තව්වාබ්

(iii) අල්ලාහ් සියලු ජීවින් මැවීමෙන් පසු තම පොතෙහි මගේ සෙනෙහස මගේ කෝපය ඉක්මවී ඇති බව සටහන් කළේය.

මවක් තම බිළිඳාට කරන සෙනෙහසට වඩා 70 ගුණයකින් අල්ලාහ් තම ගැත්තන්ට සෙනෙහස කරයි.

02 (i) මුහම්මද් නබි (සල්) තුමාණන්ට

(ii) ගුප්ත දේවල් / ජීවිතයට අවශ්‍ය නීති / ආගමික වත් පිළිවෙත් / සාරධර්ම

(iii) 6666 ආයත් / 114 සූරා / 30 ජුස්උ

03 (i) නූහ් (අලෛ) / ඉබ්රාහිම් (අලෛ) / මූසා (අලෛ) / මුහම්මද් (සල්)

(ii) ආදම් (අලෛ) - 10 / ඉබ්රාහිම් (අලෛ) - 10 / මූසා (අලෛ) - 10 / ඉද්රිස් (අලෛ) - 30 / ශීද් (අලෛ) - 50

04 (i) සලාතය පව්කමා කරයි / සලාතය ආලෝකය දෙයි / සලාතය උසස් තරාතිරමක් ලබාදෙයි / සලාතය ඉටුකරන්නන්ට මලාඉකාවරුන් ප්‍රාර්ථනා කරති

(ii) සලාතය සිතට සුවය ලබාදෙයි / සලාතය ආරෝග්‍ය ලබාදෙයි / සලාතය එකඟතාවය ඇති කරයි / සලාතය කාල කළමනාකරණය පුහුණු කරයි

(iii) අස්සලාතු මිප්තාහුල් ජන්නා, සලාතය සුවර්ගයේ පිවිසුම් දොරටුව

05 (i) ප්‍රථම තක්බීර් කීම / සුරත්තුල් පාත්තිහා සියලු රක්අත්වල පාරායනය කිරීම / අවසන් ''අත්තහියියාත්'' පාරායනය කිරීම

(ii) දුආඋල් ඉප්තිතාහ් පාරායනා කිරීම / සුරතුල් පාත්තිහාවට පෙර ''අඌදු'' කීම / රුකුවෙහි තුන්වතාවක් තස්බීහ් කීම

(iii) සතුටුදායක පණිවිඩයක් ලැබුනොත් / තමාගේ කාර්යයන් පහසු වුනොත් / ජයග්‍රහණ ලැබුනොත් / අනතුරකින් බේරුණු අවස්ථාවක